# මෙහෙමත් පඬියෝ

මෙරට තරම් පඬියන් ඇති වෙනත් රටක් මෙලොව තිබිය නොහැකි යැයි සිතෙන තරමට මෙහි පඬියෝ වෙති. මේ පඬිවරුන් බොහෝ දෙනා එකඟවන එක් කරුණක් වෙයි. ඔවුන් බොහොමයකට අනුව මෙරට නුගතුන්ගේ රටකි. කරදිය වළල්ලෙන් වට වී ඇති මේ ද්‍රපතේ ඇත්තේ කොදෙව් මානසිකත්වයකි. බටහිර රටවල දැනුමේ සිදු වී ඇති වර්ධනයන් කොදෙව්වෝ නොදනිති. විශේෂයෙන් ම සිංහල ජාතිවාදීහු නො දනිති. සිංහල බෞද්ධ උගත්තු ළිං මැඩියෝ වෙති. ඔවුන් තවමත් ජීවත්වන්නේ දහහත්වැනි දහඅටවැනි සියවස්වල ය, නැතහොත් එයටත් ඉහත ය.

එහෙත් පඬියන්ට අනුව පඬියෝ එසේ නො වෙති. ඔවුහු විසිවැනි සියවසේ නොව බටහිර දැනුම අතින් විසිඑක් වැනිසියවසේ ජීවත් වෙති. මේ ඇතැමුන් ඉංගිරිසි පොත් කිහිපයක් කියවා ඇති බව පැහැදිලි ය. එහෙත් ඒ පොත්වල ඇති ප්‍රවාද ආදිය ඔවුන් විසින් තේරුම්ගනු ලැබුවේ කෙසේ ද යන්න තරමක ප්‍රශ්නයකි. තම තම නැණ පමණින් දැන ගත යුතු ය යන ලෝවැඩ සඟරා කවි පදය මෙහි දී අපට මතක් වෙයි. ඔවුන්ගේ බසින්, එනම් ඔවුන් විසින් අනුකරණය කෙරෙන බටහිරයන්ගේ බසින්, කියන්නේ නම් ඔවුන්ට විවිධ කියවීම් ඇත. දැන් හැම පඬියකු ම පාහේ ඊනියා කියවීමක් ගැන කියවනු ඇසිය හැකි ය. ඕනෑම කෘතියකට විවිධ කියවීම් ඇතැයි ඇතැම් පඬියකු කියනු ඇත. එහෙත් පඬියාගේ තරම එයින් ම පැහැදිලි වෙයි. එවැනි පොදු කෘතියක් නැත. කර්තෘට කෘතියක් ඇත. අප කරන්නේ අපේ කෘති නිර්මාණය කිරීම ය. මේ පඬියෝ ද විවිධ කෘති නිර්මාණය කරති. ඒ කරන්නේ තම තම නැණ පමණින් ය.

පඬියෝ අපට ගරහති. අපේ නොදැනුම ගැන කියති. තම තම නැණ පමණින් නිර්මාණය කරගත් බටහිර දැනුම් එකම දැනුම යැයි විශ්වාස කරති. ඒ දැනුම් රාශියක් එකම දැනුමක් වන්නේ කෙසේ ද යන්න ද ප්‍රශ්නයකි. එයට පඬියන් දෙන පිළිතුරක් නැත. ඒ කෙසේ වෙතත් පසුගිය අවුරුදු පන්සියයක කාලයක බටහිර බිහි කෙරුණු දැනුම පමණක් වාස්තවික දැනුමක්, යථාර්ථයක් වන්නේ කෙසේ දැයි පඬියෝ අපට නො කියති. ඊනියා වාස්තවික දැනුමක් ලැබීමට වාස්තවිකත්වයක් තිබිය යුතු ය. එවැනි වාස්තවිකත්වයක් ඇති බව පඬියන් දන්නේ කෙසේ ද? වාස්තවිකත්වය දැනගන්නේ ඉන්ද්‍රිය ගෝචරව ද? එසේ නොමැතිව ද? ඉන්ද්‍රිය ගෝචර දැනුමක් වාස්තවික වන්නේ කෙසේ ද? සියළු සතුන් අතරින් ඊනියා වාස්තවික දැනුම ලැබීමට හැකි ඉන්ද්‍රිය මිනිසාට පමණක් තිබෙන්නේ කෙසේ ද? අනෙක් අතට ඉන්ද්‍රිය ගෝචර නොවූ දැනුමක් වේ ද? ඒ දැනුම ලබාගන්නේ කෙසේ ද? ඉන්ද්‍රිය ගෝචර නොවූ දැනුම වාස්තවික ද?

පඬියන් සෑම විට ම සඳහන්කරන්නේ ලාංකේය දැනුමේ දරිද්‍රතාව ගැණ ය. බටහිර රටවල ඇති දැනුම ගැන ඔවුහු මහත් අභිරුචියෙන් කියවති. මෙරටින් ලෝක මට්ටමේ දැනුම් බිහි වී නැතැයි ඔවුහු කියති. අර කසිකබල් ජාත්‍යන්තර සම්මාන දිනූ චිත්‍රපට් අධ්‍යක්ෂවරුන් ඔවුන්ට එහි දී අමතක වේ. එහෙත් ප්‍රශ්නයක් වෙයි. පඬියන් ඊනියා ජාත්‍යන්තර මට්ටමේ දැනුම් නිර්මාණය කරන්නේ නැත්තේ ඇයි? ඒ ලාංකේය පොදු දැනුම් දරිද්‍රතාව ඔවුන්ට ද හිමි වී ඇති බැවින් ද? නූතන ෂේක්ස්පියර්ලා නිව්ටන්ලා මෙන් කතාකරන පඬියන්ට කළ හැක්කේ තම තම නැණ පමණින් දැනගන්නා බටහිර දැනුම ගැන ආඩම්බරවීම පමණකි. අනුන්ගේ අබරණ පැළඳ උජාරුවෙන් මගුළට සහභාගිවන කතුන් හා පඬියන් අතර ඇති වෙනසක් වේ. ඒ කාන්තාවෝ තමන් පැළඳ සිටින්නේ අනුන්ගේ අබරණ බව දනිති.

පොළොවට පොල් වැටෙන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට ප්‍රසිද්ධ පිළිතුරු දෙකක් බටහිරයන් නිර්මාණය කර ඇත. එක පිළිතුරක් නිව්ටන්ගේ ය. අනෙක අයින්ස්ටයින්ගේ ය. මේ දෙකෙන් නිවැරදි එකක් වේ දැයි පඬියෝ නො දනිති. ඔවුන් ඒ දෙකෙන් එකක්වත් නොදන්නේ තම තම නැණ පමණේ ප්‍රශ්නයක් නිසාවෙනි. එයට පඬියන්ගේ බටහිර ස්වාමීන් කියන්නේ අයින්ස්ටයින් නිව්ටන්ට වඩා ඊනියා යථාර්ථයට සමීප බව ය. බොහෝ බටහිරයන්ට අනුව අයින්ස්ටයින් කර ඇත්තේ නිව්ටන් ගිය මගේ ඉදිරියට ගොස් යථාර්ථය දෙසට වර්ධනයක් ඇතිකිරීම ය. එසේ කීමට නම් බටහිරයන් යථාර්ථය දැන සිටිය යුතු ය. නොදන්නා යථාර්ථයකට වඩා සමීප අහවලා යැයි කියන්නේ කිනම් පදනමකින් ද? අනෙක් අතට ඇතැම් බටහිර පඬිවරුන් ම පෙන්වා දී ඇති ආකාරයට අයින්ස්ටයින් එසේ වර්ධනයක් කර නැත. ඔහු කර ඇත්තේ නිව්ටන්ට හාත්පසින්ම වෙනස් දෙයක් ඉදිරිපත් කිරීම ය. ඒ දෙදෙනා අහසට පොළොව මෙනි.

ඒ කුමක් වුවත් පඬියෝ බටහිර දැනුම පමණක් ඊනියා යථාර්ථය හෝ යථාර්ථයට මග හෝ ලෙස සලකති. මෙරට ඊනියා ජනවාර්ගික ප්‍රශ්නය පමණක් නොව එයට දෙන පිළිතුර ද බටහිරයන්ගෙන් ලබාගත් දෑ වෙයි. මහින්ද රාජපක්ෂ

© Prof. Nalin De Silva

මහතා මේ පඬියන්ගෙන් දේශජ විසඳුමක් බලාපොරොත්තුවන්නේ නම් එතුමාට දෙවියන්ගේ ම පිහිට ය. එහෙත් ප්‍රශ්නය වනුයේ මොන දෙවියන්ගේ පිහිට ද යන්න ය. ලෝකය මැවූ දෙවිවරුම රාශියක් වෙති. එනම් විවිධ සංස්කෘතීන්වල විවිධ දෙවියන් මවා ඇත. පඬියන්ගේ හා පඬියන් පසුපස යන ඇතැම් භික්ෂූන් වහන්සේලාගේ ද අවාසනාවකට සර්වාගමික දෙවි කෙනකු නැත. ලෝකයේ බොහෝ යුද්ධ කෙරී ඇත්තේ ඊනියා ඇත්ත දෙවියන් කවුරුන් දැයි තීරණය කිරීමට ය. දෙවියන් ගැන දැනුම තීරණය වන්නේ ද හැමදාමත් එපා යැයි කියන ඊනියා කාලකන්නි යුද්ධයෙන්ම ය. පඬියන්ට යුද්ධය කාලකන්නි වන්නේ යුද්ධයෙන් සිංහලයන් නැසීමට නොහැකි විට ය. ඇතැම් හිටපු දන්ත වෛද්‍ය මහාචාර්යවරුන් අතනින් මෙතනින් අහුලාගත් මාක්ස්වාදී ප්‍රවාදවලට අනුව ආර්ථිකවාදී යටත්විජිතවාදී කතා කීවත් අද අරාබිකරයේ යුද්ධ කෙරෙන්නේ භූදෙක් ක්ෂයවෙමින් පවතින තෙල් නිධිවල අයිතිය ලබාගැනීමට පමණක් නොව ලෝකය මැව්වේ කිනම් දෙවියන්දැයි තීරණයකිරීම සඳහාත් ය. කොපමණ කීවත් මේ මහාචාර්යවරුන්ට ජගත් යටත්විජිතවාදයේ එකිනෙකට බැඳි ආර්ථික, දේශපාලන හා සංස්කෘතික සංරචක හඳුනාගත නොහැක්කේ තම තම නැණ පමණින් කරන නිර්මාණවල අඩු පාඩු ඇති බැවිනි.  මොවුන් සියළු දෙනාටම බටහිර දැනුම් ආධිපත්‍යයේ පීඩාව නොතේරෙන්නේ ඔවුන්ගේ වෘත්තිය ඒ දැනුම මත පදනම් වන බැවින් විය හැකි ය.

පඬියෝ සාමාන්‍යයෙන් සිංහල බෞද්ධ විරෝධී වෙති. පසුගිය දා අද ලංකාවේ ඉහළින් ම වැජඹෙන පඬියකු පඬි සභාවක පඬි කතාවක් කියා ඇත. ඔහු කියා ඇත්තේ බුද්ධිමතකු ලෙස ඔහුට දෙවියන් නැතැයි කීමට තරම් සාක්ෂි නැති බව ය. ඒ අතර ම ඔහු කියා ඇත්තේ පුනරුත්පත්තිය ඇතැයි කීමට තරම් සාක්ෂි ද ඔහුට නැති බව ය. මේ පඬි කතාව පසුපස ඇත්තේ කුමක් ද? ඔහු දෙවියන් ඇතැයි කීමට තරම් සාක්ෂි තමාට නැති බව නො කීවේ ඇයි? අනෙක් අතට පුනරුත්පත්තිය නැතැයි කීමට තරම් සාක්ෂි නැති බව නො කීවේ ඇයි? කෙලින් ම නොකීවත් ඔහුගේ පඬි කතාව කුමක් සඳහා දැයි අපට තේරුම් ගත හැකි ය. දෙවියන් නැතැයි කීමට සාක්ෂි නැතැයි යන්න පදනම් කරගනිමින් දෙවියන් ඇතැයි කීමට සාක්ෂි ඇතැයි යන නිගමනයට ළිං මැඩියන් වුව ද සිංහල බෞද්ධ අපි නො එළඹෙමු. එහෙත් පඬියාට අවශ්‍ය වී ඇත්තේ කුමක් නිෂේධ කිරීමට ද යන්න අපට සිතාගත හැකි ය. නිෂේධයට සාක්ෂි නැති බව පඬියා කියන්නේ දෙවියන් සම්බන්ධයෙනි. පැවතීමට සාක්ෂි නැති බව පඬියා කියන්නේ පුනරුත්පත්තිය සම්බන්ධයෙනි. පඬියාට ඒ පඬි සභාවේ සිටි අනෙක් පඬියන් රැවටීමට හැකිවන්නට ඇත. එහෙත් ළිං මැඩි සිංහල බෞද්ධයන් රැවටීම පඬියාට පමණක් නොව පඬියාගේ බටහිර පඬි පරපුරට ම නො හැකි ය. ඒ කෙසේ වෙතත් පඬියා තමන් බුද්ධිමතකු ලෙස සලකන බව පෙනෙයි. සම්මත ජාතියේ ප්‍රවාදයකින් හෝ සංකල්පයකින් හෝ කිසිම ක්ෂෙත්‍රයක දායකත්වයක් කරනැති පඬියා තමා බුද්ධිමතකු ලෙස සලකන්නේ කිනම් පදනමකින් ද? ගිනි පෑගීමේ හාස්කම් නැතැයි කියන කතෝලික පවුල්වල උපන් පඬියන් කතෝලික පූජකවරුන්ගේ හාස්කම් ගැන කිසිවක් නොකරන්නේ ඇයි?

පඬියන්ගේ මහත් ඇගයීමට ලක්වන කසිකබල් මාක්ස්වාදය හා තුට්ටු දෙකේ අපෝහකය ගැන මා පොත් පිංච දෙකක් ලියා අවුරුදු විස්සකට ආසන්න වුවත් පඬියෝ ඒ නුදුටු ඇසින් සිටිති. පඬියන්ටත් මාක්ස්වාදය හා ජාතිකත්වය අතර හොර සහවාසයක් ඇතිකිරීමට කැසකවන ඊනියා ජාතිකවාදීන්ටත් හැකි නම් ඒ පොත්පිංචවලට පිළිතුරක් ලිවීමට අභියෝග කරමි. අද මාක්ස්වාදය අනෙක් බොහෝ බටහිර දැනුම් මෙන් ම සිංහලත්වයට විරුද්ධව යොදා ගැනෙයි. ජගත් යටත්විජිතවාදය පරාජය කළ යුතු ය. එහෙත් ඒ කළහැකි වන්නේ මාක්ස්වාදය ඔස්සේ හෝ ජාතිකත්වයට මාක්ස්වාදය මුසුකිරීමෙන් හෝ නො වේ.

අප සඳහන්කරන්නේ ද බටහිර මතවාද ම යැයි ෆුල් බ්‍රයිට් තබා ක්වෝටර් බ්‍රයිට්වත් නොවන පඬියකු කීමට ඉඩ ඇත. ඔහු නොදනිතත් දැනුම චින්තනයක් මත පදනම්වන බව අප කියන්නේ අවුරුදු විසිපහක පමණ කාලයක සිට ය. අප යොදාගන්නා චින්තනය යන සංකල්පය ජාතික චින්තනය පිළිබඳ විසිරුණු අදහස නොවන අතර එය කිසිම දිනෙක බටහිර විද්වතකු විසින් යොදාගනු ලැබ නැත. ජාතික චින්තනය නම් විසිරුණු අදහස ඉදිරිපත්වීමට පෙර ද අපි යුදෙව් චින්තනය යන සංකල්පය යොදාගත්තෙමු. බටහිර ඇතැම් සමාජවිද්‍යාඥයන් දැනුම් නිර්මාණ ගැන කතාකරතත් ඒ සංස්කෘතිය හෝ චින්තනය හෝ පදනම් කරගනිමින් නො වේ. දැනුම පිළිබඳ අපේ දැනුම වර්ධනයකිරීමේ දී සංකල්පීය දැනුම ශූන්‍යය යනුවෙන් නාගර්ජුනපාදයන් කර ඇති ප්‍රකාශය නම් අපි යොදාගනිමු. පඬියෝ මේ කිසිවක් නො දනිති. ඔවුන් දන්නේ අපේ නූගත්කම ගැනත් ඔවුන්ගේ බරවා උගත්කම ගැනත් ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva